# අර්ශස් රෝගය සඳහා පාෂාණ භාවිතයෙන් නිල තෙරපීමේ පාරම්පරික වෛද්‍ය ක්‍රමය

පාරම්පරික වෛද්‍ය ඩබ්ලිව්. දයාසිරි ද සිල්වා

ලෝකයේ ඉතා පැරණි වෛද්‍ය ක්‍රමයක් වන පාරම්පරික හෙළ වෙදකමේ දේහ බල, ආයු බල, බුද්ධි බල වර්ධනය උදෙසා ප්‍රතිකාර ක්‍රම අන්තර්ගත විය. ගාල්ල, දඩල්ල විෂ, ගෙඩි, වණ, පිළිකා වෙදකමේ දී ගස්, වැල්, කොළ, පොතු, මල්, මැලියම් හා මුල් ඇති ව ඖෂධ ශාක යොදා ගෙන කරනු ලබන ප්‍රතිකාරවලට අමතර ව එතරම් සුලබ නොවන පාෂාණ භාවිතයෙන් රෝග සුවපත් කිරීමේ චිකිත්සා ක්‍රමය අප රටට ඉතා අගනා උරුමයක් වැනි ය. මෙහි දී පාරම්පරික නිල ශාස්ත්‍රය පිළිබඳ ඥාණය ද යොද ගනිමින් සිදුකරන මෙම ප්‍රතිකාර ක්‍රමය දක්ෂිණ ලංකාවට අනන්‍ය වූ පාරම්පරික වෙද සතර පිළිබිඹු කරයි. මේ සඳහා යොද ගන්නා පාෂාණ වර්ග 8 කි.

1. නිල් පාෂාණ
2. කළු පාෂාණ
3. තිරුවාන (රෝස)
4. පඬියම් (රතු)
5. පසිංගල් (සුදු)
6. පළිඟු (නිල්)
7. කහට පළිඟු (නිල්)
8. අම්බතිස් (දුඹුරු)

මෙම වෙද පරම්පරාව ගෙඩිවන පිළිකා මෙන්ම සර්පවිෂ, කැඩුම්බිඳුම් සඳහා ද කීර්තිමත් වෙද පරම්පරාවකි. පුස්කොළ පොත්, ශිලා ලේඛන රාශියක් මෙම වෙදකම සතු දැනුම මතු පරපුර උදෙසා දයාද කරනු ලැබ ඇත. ලොව කිසිම වෛද්‍ය විද්‍යාවකට සුව කළ නොහැකි ඇට මස් දියවන රෝග, කැඩුම් බිඳුම් රෝග මෙම දේශීය වෛද්‍ය ක්‍රමය මගින් සුව කළ හැක. මෙහි දී හඳුනා ගන්නා විෂ ගෙඩි වණ පිළිකා ඇති වීමේ රෝග ලක්ෂණ ලෙස,

- බඩ පෙරළීම හා ක්‍රිමි රෝග
- මල සමඟ ලේ පිට වීම
- මල සමඟ සීදන් පිටවීම
- ගුද මාර්ගයේ ගෙඩි ඇති වීම
- ගුද මාර්ගයේ තුවාල සෑදීම හා කැක්කුම් වැඩි වීම
- බඩ පිපුම හා උරහිස, උකුල, කලව, ඉකිලිය, තුනටිය ආදී ස්ථාන වල වේදනාව
- තුවාල සුව නොවීම නිසා ඔඩු සෑදීම
- මහ බඩවැල එළියට ඒම නිසා පිළිකා සෑදීම

මෙම ප්‍රතිකාරයේදී පළමුව බඩ විරේකය සඳහා ඖෂධ ලබා දෙයි. එමෙන් ම ලේ ශුද්ධ වීම සඳහා කෂාය වර්ග ද යොදයි. තුවාල සුව වීම සඳහා කුර්දූර් තෙල් ද ගෙඩි මොළොක් වීම සඳහා චිත්‍රකාදී තෙල් ද යොදයි. පසුව මෙම වේදනාකාරී අර්ශස් අවස්ථා සඳහා තුනටිය හා කලව ආශ්‍රිත විශේෂ නිල පාෂාණ වර්ග 8ක් උපයෝගී කර ගනිමින් තෙරපීම සිදුකරයි. ප්‍රතිකාරයෙන් පසු ව ආහාර විහරණ වල විශේෂ පාලනයක් අවශ්‍ය වන අතර එහි දී මස් වර්ග හා උෂ්ණ ආහාර වර්ජනය කල යුතුය.

මෙම ප්‍රතිකාරය මුල් අවස්ථාවේ සිට දින තුනෙන් තුනට ද පසුව සතියකට වරක් බැගින් ද එයිනුදු පසුව සති 2කට වරක් බැගින් ද සිදු කරයි. ප්‍රතිකාරය සඳහා යොදන ඖෂධ යෝග කිහිපයක් පහත දැක් වේ.

**කෂාය වර්ග**

ගුගුල් තිපල් එහි සමතර වන්නේ - කකාරමින් අට එකට හෙලන්නේ
අරළු බුළුත් ප්‍රතිවාප දමන්නේ - සියලුම ගඩු පිළිකා නැතිවන්නේ

දියමිත් රත්නිටු තිපලින්නේ - හිරමුසු දෙවගේ එක්කර ගන්නේ
කකාරමින් අට එකට හෙලන්නේ - බිතල සැම ගඩු පිළිකා නසන්නේ

**කැඳ වර්ග**

- රත්කරල් හැබ, හීනටි හාල් හා පොල්කිරි දමා පිස ගත් කැඳ
- කොහිල කැඳ
- බෙහෙත් අනෝද කොළ කැඳ

- හාතාවාරිය යුෂ කැඳ පිසයා - ගන්සූරිය පොතු මැඩ යුෂ කැඳයා
  එරබදු පොතු මැඩ යුෂ ගෙන කැඳයා - සැම විසදූ නසමින් දන දේයා

- මිරිකුළු මුල මැඩ ගෙන යුෂ කැඳ පිස - බුලත් එගිරිද කැඳ පිසවීම ලෙස
  වෙන වෙන දී නොවරදවා කැඳ පිස - සැම පිළිකා ගඩුව නසයි එම ලෙස

**පිළිකා සඳහා මැල්ලුම් වර්ග**

- අංකෙන්දත් තරණය කොළ පොතු ගෙන - ගොන්කිරි කුඩු මිරිස් තිකුළු ගෙන
  මෙකී කොළත් සහ කහ ලුණු ලා ගෙන - සැම ගඩු වලට ම මලවා බඳිනුව

- කැප්පෙටි වෙල්ලන් ගිරි කොළ පොතු ගෙන - වීර දෙමට කරදිය පොතු ගනිමින
  වරා පොතු ද කහ ලුණු ලා කොට මින - උණු ගන්වා බඳු සැම ගෙඩි
  උනුවෙන

**පිළිකා සඳහා තැවිලි වර්ග**

- වේලා ඇට කුඹුරු ද පුස් මදයේ - අත්තන ඇට සහ අබිනුත් ගෙන යේ
  වියන්දුඹුලු තැද ගිනිපස් ගෙන සමයේ - තිමුල් කිරිත් තිඹිරි ද පොතු සමයේ
- වෙල්ලොන්තිර සහ පොතු කරදිය තුට - හොඬලය අත්තන ඇට කරදිය තුට
  ඔලිඳ වරා කොළ මිරිකුළු මුල්තුට - කුඹුරු ඇටය පොල් සමඟින් පොඩිකොට

ඉහත ප්‍රතිකාර පන්තීන්ගෙන් පිළිබිඹු වන්නේ මෙම වෙදකම සතු පරිපූර්ණ භාවයයි. මෙහි දී පාෂාණ භාවිතයෙන් නිල තෙරපුම ට අමතරව විෂ ගෙඩි වණ පිළිකා වලට අදළ වෙනත් ප්‍රතිකාර ක්‍රම ද යොද ගනු ලබන අතර මෙවන් අගනා හෙළ වෙදකම් මතු පරපුරට ද සුරක්ෂිත කිරීම අප සතු වගකීම වේ.